සති පාසල

7 ශ්‍රේණිය | විද්‍යාව | අගෝස්තු 2වන සතිය

14 - තාපය හා උෂ්ණත්වය

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 44,45,46 පිටු අංක යටතේ ඇති **ද්‍රවාංකය සහ තාපාංකය** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- පිටු අංක 45 හි දක්වෙන ක්‍රියාකාරකම 14.3 ද පිටු අංක 46 හි දක්වෙන ක්‍රියාකාරකම 14.4 ද කෙරෙහි අවධානය යොමු කරන්න.
- පිටු අංක 48 හි දක්වෙන ක්‍රියාකාරකම 14.5, 14.6, 14.7 කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 47 පිටු අංක යටතේ ඇති **උෂ්ණත්වමානය නිවැරදිව භාවිත කිරීම** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 49,50 පිටු අංක යටතේ ඇති **වෛද්‍ය උෂ්ණත්වමානය** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- ඔබ උගත් කරුණු ඇසුරෙන් කෙටි සටහනක් සකස් කරන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය විද්‍යාව දෙවන පෙළ පොත (පිටු අංක 44 සිට 50)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=21#section-14
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=986&section=14
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=dIgxvSDzS84&t=60s

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- තාපාංකය සහ ද්‍රවාංකය යන පද පැහැදිලි කිරීම.
- මානව ශරීර උෂ්ණත්වය නියත අගයක් ගන්නා බවත් උණ තත්ත්වය නිශ්චය කරගැනීම සඳහා වෛද්‍ය උෂ්ණත්වමානය භාවිත කරන බවත් හඳුනා ගැනීම.

04. ඇගයීම

1) තාපය සන්නයනය කළ හැකි ද්‍රව්‍ය තාප ....................................... නම් වේ.
2) සූර්යයාගේ සිට පෘථිවියට තාපය සංක්‍රමණය වන ක්‍රමය ...................... ලෙස හැඳින්වේ.
3) ලෝහ හැන්දකින් හොද්දක් හැඳිගාන විට අතට තාපය සංක්‍රමනය වන ක්‍රමය නම් ........................................ යි.
4) රුවල් ඔරු භාවිතාකරන ධීවරයින් රාත්‍රී කාලයේ දී මුහුදු යන්නේ ..................... සුළං ආධාරයෙනි.
5) ද්‍රව තුලින් තාපය සංක්‍රමණය වන්නේ ......................................... මගිනි.